# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1314 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 13/08/2024 පැය 1740

## මාධ්‍ය නිවේදනය

### මහනුවර ඓතිහාසික ඇසළ පෙරහර - ශ්‍රී ලංකා පොලිසියේ ආරක්ෂක වැඩපිළිවෙල සහ රථවාහන සැලැස්ම

ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ උදෙසා පවත්වනු ලබන මහනුවර ඓතිහාසික ඇසළ පෙරහර මංගල්‍ය මෙවරත් 2024.08.10 වන දින සිට 2024.08.14 වන දින දක්වා කුඹල් පෙරහරද, 2024.08.15 වන දින සිට 2024.08.19 වන දින දක්වා රන්දෝලි පෙරහරද, 2024.08.20 වන දින දහවල් පෙරහරද උත්කර්ෂවත් අන්දමින් පැවැත්වේ.

ශ්‍රී ලංකා පොලිසිය විසින් පෙරහර වෙනුවෙන් විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් සහ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇති අතර, ඒ සඳහා පොලිස් නිලධාරීන් 6000 කට අධික ප්‍රමාණයක් රාජකාරි යොදවා ඇත.

පෙරහර පවත්වන කාල සීමාව තුළ මාර්ග බාධක ආරක්ෂක රාජකාරි, වාහන හා පුද්ගලයින් පරික්ෂා කිරීම, සංචාරයිකයින්ට මගපෙන්වීම හා රථ වාහන ගාල් කිරීම් ඇතුළු විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් දියත් කර ඇත.

පෙරහර කාලසීමාවන් තුළ ක්‍රියාත්මක රථවාහන සැලැස්ම හා දෛනික රථවාහන සැලැස්ම පහත පරිදි වේ.

- **පස්වන කුඹල් පෙරහර - 2024.08.14**

  2024.08.14 රාත්‍රී 7.15 ට දළදා පෙරහර සහ සතර දේවාල පෙරහර දළදා වීදිය, යටිනුවර වීදිය ඔස්සේ රජ වීදියෙන් ගමන් කර ගෙවැදීමට නියමිතය.

  **එම කාලය තුළ ක්‍රියාත්මක රථ වාහන සැලැස්ම හා විකල්ප මාර්ග පහත පරිදි වේ.**

  - කටුගස්තොට සිට මහනුවර නගරයට පැමිණෙන සියළුම බර වාහන මහයියාව හන්දියෙන් තිලක් රත්නායක මාවත ඔස්සේ පොලිසිය හන්දියෙන් මහනුවර නගරය වෙත ගමන් කල හැක.

  - කටුගස්තොට සිට මහනුවර නගරයට පැමිණෙන සියළුම සැහැල්ලු වාහන ඩී.එස්. සේනානායක වීදිය ඔස්සේ පැමිණ හරස් වීදිය ඔස්සේ යටිනුවර වීදියට පැමිණ දකුණට හැරී වීර මක්කම් පල්ලිය අසලින් වමට ධාවනය කර තිලක් රත්නායක මාවත ඔස්සේ ගමන් කල හැක.

  - මහනුවර නගරය දෙස සිට කටුගස්තොට දෙසට පිටවන වාහන පොලිසිය අසලින් තිලක් රත්නායක මාවත ඔස්සේ මහයියාව දෙසට ගමන් කල හැක.

  - තැන්නේකුඹුර හා අම්පිටිය දෙසින් පැමිණෙන වාහන සංඝරාජ මාවත ඔස්සේ වේල්ස් පාර්ක් හන්දියට පැමිණ ඇහැලේපොළ කුමාරිහාමි මාවතෙන් දකුණට හැරී බෝගම්බර, දුම්රියපොළ අසලින් කොළඹ දෙසට ගමන් කරන වාහන වම් පසටද, නගරය දෙසට ගමන් කරන වාහන දකුණු පසටද ගමන්

කල හැක. එසේම රජපිහිල්ල මාවත හන්දියෙන් පල්ලිය පාර ඔස්සේ මහනුවර නගරයට ඇතුළු වීය හැක.

- නගරයේ සිට අම්පිටිය, තෙල්දෙණිය මාර්ගයේ ගමන් කරන වාහන ඔරලෝසු කණුව වටරවුමෙන් ටොරින්ටන් හන්දිය, පල්ලිය පාර ඔස්සේ වේල්ස් පාර්ක් හන්දිය හරහා සංඝරාජ මාවත ඔස්සේ ගමන් කල හැක. තවද, බෝගම්බර වට රවුමේ ඇහැලේපොළ කුමාරිහාමි මාවත, රජපිහිල්ල මාවත, සංඝරාජ මාවත ඔස්සේ අම්පිටිය හා තැන්නේකුඹුර දෙසට ගමන් කල හැක.

- කොළඹ දෙසින් ඇතුළු වන හා මහනුවර නගරයෙන් කොළඹ දෙසට පිට වන වාහන පරණ පේරාදෙණිය පාර හා විලියම් ගොපල්ලව මාවත ඔස්සේ ගමන් කල හැක.

## ■ ප්‍රථම රන්දෝලි පෙරහර - 2024.08.15

2024.08.15 රාත්‍රී 6.45 ට ශ්‍රී දළදා පෙරහර සහ සතර දේවාල පෙරහර දළදා වීදිය, ඩී.එස්. සේනානායක වීදිය, පන්සල පාර ඔස්සේ ඉහලට පැමිණ දේව වීදිය, කොළඹ වීදිය, කොටුගොඩැල්ල වීදිය, හරස් වීදිය, ඩී.එස් සේනානායක වීදිය, රජ වීදිය ඔස්සේ ඉහලට ගමන් කර ගෙවැදීමට නියමිතය.

**එම කාලය තුළ ක්‍රියාත්මක රථවාහන සැලැස්ම හා විකල්ප මාර්ග පහත පරිදි වේ.**

- කටුගස්තොට සිට මහනුවර නගරයට පැමිණෙන සියළුම බර වාහන මහයියාව හන්දියෙන් තිලක් රත්නායක මාවත ඔස්සේ පොලිසිය හන්දියෙන් මහනුවර නගරය වෙත ගමන් කළ හැක.

- කටුගස්තොට දෙසින් පැමිණෙන සැහැල්ලු වාහන ඩී.එස් සේනානායක වීදිය ඔස්සේ පැමිණ කන්දේ වීදිය ඔස්සේ මීරමක්කම් පල්ලිය අසලින් ඉදිරියට ගමන් කර තිලක් රත්නායක මාවත ඔස්සේ ගමන් කළ හැක.

- මහනුවර නගරය දෙස සිට කටුගස්තොට දෙසට පිටවන වාහන දළදා වීදිය, යටිනුවර වීදිය, කන්දේ වීදිය, ඩී.එස්.සේනානායක වීදිය ඔස්සේ ගමන් කල හැක.

- තැන්නේකුඹුර හා අම්පිටිය දෙසින් පැමිණෙන වාහන සංඝරාජ මාවත ඔස්සේ වේල්ස් පාර්ක් හන්දියට පැමිණ ඇහැලේපොල කුමාරිහාමි මාවතෙන් දකුණට හැරි බෝගම්බර, දුම්රිය පොල අසලින්ද කොළඹ දෙසට යාමට වම් පසටද, නගරයට යාමට දකුණු පසට යා යුතු වේ. එසේම රජ පිහිල්ල මාවත හන්දියෙන් පල්ලිය පාර ඔස්සේ මහනුවර නගරයට ඇතුළුවිය හැක.

- නගරයේ සිට අම්පිටිය, තෙල්දෙණිය මාර්ගයේ ගමන් කරන වාහන ඔරලෝසු කණුව වටරවුමෙන් දළදා වීදිය ඔස්සේ රැජිණ හෝටල් පැති දොරටුව අසලට පැමිණ බෝට්ටු සේවය අසලින් සංඝරාජ මාවතට පැමිණ ගමන් කළ හැක. එසේම බෝගම්බර වට රවුම, ඇහැලේපොල කුමාරිහාමි මාවත, රජ පිහිල්ල මාවත, වේල්ස් පාර්ක් හන්දිය, සංඝරාජ මාවත ඔස්සේ අම්පිටිය හා තැන්නේකුඹුර දෙසට ගමන් කල හැක.

- මහනුවරට කොළඹ දෙසින් ඇතුළු වන හා නගරයෙන් කොළඹ දෙසට පිටවන වාහන සඳහා පරණ පේරාදෙණිය පාර හා විලියම් ගොපල්ලව මාවත භාවිතා කල හැක.

## ■ දෙවන රන්දෝලි පෙරහර - 2024.08.16

2024.08.16 රාත්‍රී 7.08 ට ශ්‍රී දළදා පෙරහර සහ සතර දේවාල පෙරහර දළදා වීදිය, ඩී.එස් සේනානායක වීදිය, කොළඹ වීදිය, යටිනුවර වීදිය, රජ වීදිය, කොටුගොඩැල්ල වීදිය, හරස් වීදිය, ඩී.එස් සේනානායක වීදිය, රජ වීදිය ඔස්සේ ඉහලට ගමන් කර මාලිගාවට ගෙවැදීමට නියමිතය.

- කටුගස්තොට සිට මහනුවර නගරයට පැමිණෙන සියළුම බර වාහන මහයියාව හන්දියෙන් තිලක් රත්නායක මාවත ඔස්සේ පොලිසිය හන්දියෙන් මහනුවර නගරය වෙත ගමන් කළ හැක.

- කටුගස්තොට දෙසින් පැමිණෙන සැහැල්ලු වාහන ඩී.එස් සේනානායක වීදිය ඔස්සේ පැමිණ කන්දේ වීදිය ඔස්සේ මීරමක්කම් පල්ලිය අසලින් ඉදිරියට ගමන් කර තිලක් රත්නායක මාවත ඔස්සේ ගමන් කළ හැක.
- කටුගස්තොට දෙසට පිටවන වාහන පොලිසිය අසලින් තිලක් රත්නායක මාවත ඔස්සේ මහයියාව දෙසට ගමන් කල හැක.
- තැන්නේකුඹුර හා අම්පිටිය දෙසින් පැමිණෙන වාහන සංඝරාජ මාවත ඔස්සේ වේල්ස් පාර්ක් හන්දියට පැමිණ ඇහැලේපොල කුමාරිහාමි මාවතෙන් දකුණට හැරී බෝගම්බර, දුම්රිය පොල අසලින්ද කොළඹ දෙසට යාමට වම් පසටද, නගරයට යාමට දකුණු පසට යා යුතුය. එසේම රජ පිහිල්ල මාවත හන්දියෙන් පල්ලිය පාර ඔස්සේ මහනුවර නගරයට ඇතුළු විය හැක.
- නගරයේ සිට අම්පිටිය, තෙල්දෙණිය මාර්ගයේ ගමන් කරන වාහන දළදා වීදිය සංඝරාජ මාවත ඔස්සේ ගමන් කල හැක.
- මහනුවරට කොළඹ දෙසින් ඇතුළු වන හා නගරයෙන් කොළඹ දෙසට පිටවන වාහන පරණ පේරාදෙණිය පාර හා විලියම් ගොපල්ලව මාවත භාවිතා කල හැක.

## තෙවන රන්දෝලි පෙරහර - 2024.08.17

2024.08.17 රාත්‍රී 6.51 ට ශ්‍රී දළදා පෙරහර සහ සතර දේවාල පෙරහර දළදා වීදිය, කොටුගොඩැල්ල වීදිය, කොළඹ වීදිය, යටිනුවර වීදිය, කුමාර වීදිය, කොටුගොඩැල්ල වීදිය, හරස් වීදිය, ඩී.එස් සේනානායක වීදිය, රජ වීදිය ඔස්සේ ගමන් කර ගෙවැදීමට නියමිතය.

- කටුගස්තොට සිට මහනුවර නගරයට පැමිණෙන සියළුම බර වාහන මහයියාව හන්දියෙන් තිලක් රත්නායක මාවත ඔස්සේ පොලිසිය හන්දියෙන් මහනුවර නගරය වෙත ගමන් කළ හැක.
- කටුගස්තොට දෙසින් පැමිණෙන සැහැල්ලු වාහන ඩී.එස් සේනානායක වීදිය ඔස්සේ පැමිණ කන්දේ වීදිය ඔස්සේ මීරමක්කම් පල්ලිය අසලින් ඉදිරියට ගමන් කර තිලක් රත්නායක මාවත ඔස්සේ ගමන් කළ හැක.
- කටුගස්තොට දෙසට පිටවන වාහන පොලිසිය අසලින් තිලක් රත්නායක මාවත ඔස්සේ මහයියාව දෙසට ගමන් කල හැක.
- තැන්නේකුඹුර හා අම්පිටිය දෙසින් පැමිණෙන වාහන සංඝරාජ මාවත ඔස්සේ වේල්ස් පාර්ක් හන්දියට පැමිණ ඇහැලේපොල කුමාරිහාමි මාවතෙන් දකුණට හැරී බෝගම්බර, දුම්රිය පොල අසලින්ද කොළඹ දෙසට යාමට වම් පසටද, නගරයට යාමට දකුණු පසට යා යුතු වේ. එසේම රජ පිහිල්ල මාවත හන්දියෙන් පල්ලිය පාර ඔස්සේ මහනුවර නගරයට ඇතුළු විය හැක.
- නගරයේ සිට අම්පිටිය, තෙල්දෙණිය මාර්ගයේ ගමන් කරන වාහන ඔරලෝසු කණුව අසලින් පල්ලිය පාර ඔස්සේ සංඝරාජ මාවත (වැව රවුම) ඔස්සේ ගමන් කල හැක. එදින ඔරලෝසු කණුව සිට වේල්ස් පාර්ක් දක්වා පල්ලිය පාර දෙදිශාවටම ගමන් කල හැක.
- මහනුවරට කොළඹ දෙසින් ඇතුළු වන හා නගරයෙන් කොළඹ දෙසට පිටවන වාහන පරණ පේරාදෙණිය පාර හා විලියම් ගොපල්ලව මාවත භාවිතා කල හැක.

## සිව්වන රන්දෝලි පෙරහර - 2024.08.18

2024.08.18 රාත්‍රී 6.40 ට ශ්‍රී දළදා පෙරහර සහ සතර දේවාල පෙරහර දළදා වීදිය, යටිනුවර වීදිය, හරස් වීදිය, කොටුගොඩැල්ල වීදිය, කන්දේ වීදිය, ඩී.එස් සේනානායක වීදිය ඔස්සේ පැමිණ රජ වීදියෙන් ගමන් කර ගෙවැදීමට නියමිතය.

- කටුගස්තොට සිට මහනුවර නගරයට පැමිණෙන සියළුම වාහන මහයියාව හන්දියෙන් තිලක් රත්නායක මාවත ඔස්සේ පොලිසිය හන්දියෙන් මහනුවර නගරය වෙත ගමන් කළ හැක.

- කටුගස්තොට දෙසින් පැමිණෙන සැහැල්ලු වාහන පමණක් මහයියාව, ඩී.එස් සේනානායක වීදිය ඔස්සේ පැමිණ ඒ.ඒ.ධර්මසේන මාවතෙන් හරවා තිලක් රත්නායක මාවත ඔස්සේ ගමන් කළ හැක.

- කටුගස්තොට දෙසට පිටවන වාහන පොලිසිය අසලින් තිලක් රත්නායක මාවත ඔස්සේ කටුගස්තොට දෙසට ගමන් කල හැකිය.

- තැන්නේකුඹුර හා අම්පිටිය දෙසින් පැමිණෙන වාහන සංඝරාජ මාවත ඔස්සේ වේල්ස් පාර්ක් හන්දියට පැමිණ ඇහැලේපොල කුමාරිහාමි මාවතෙන් දකුණට හැරි බෝගම්බර, දුම්රිය පොල අසලින්ද කොළඹ දෙසට යාමට වම් පසටද, නගරයට යාමට දකුණු පසට යා යුතුය. එසේම රජ පිහිල්ල මාවත හන්දියෙන් පල්ලිය පාර ඔස්සේ මහනුවර නගරයට ඇතුළු විය හැක.

- නගරයේ සිට අම්පිටිය, තෙල්දෙණිය මාර්ගයේ ගමන් කරන වාහන ඔරලෝසු කණුව වටරවුමෙන් ටොරින්ටන් හන්දිය, පල්ලිය පාර, වේල්ස් පාර්ක් හන්දිය හරහා සංඝරාජ මාවත ඔස්සේ ගමන් කල යුතු අතර වාහන තදබදයක් ඇත්නම් බෝගම්බර වටරවුම, ඇහැලේපොළ කුමාරිහාමි මාවත, රජපිහිල්ල මාවත, සංඝරාජ මාවත ඔස්සේ අම්පිටිය හා තැන්නේකුඹුර දෙසට ගමන් කල හැක.

- මහනුවරට කොළඹ දෙසින් ඇතුළු වන හා නගරයෙන් කොළඹ දෙසට පිටවන වාහන සඳහා පරණ පේරාදෙණිය පාර හා විලියම් ගොපල්ලව මාවත භාවිතා කල හැක.

## ■ අවසන් රන්දෝලි පෙරහර - 2024.08.19

2024.08.19 රාත්‍රී 6.57 ට ශ්‍රී දළදා පෙරහර සහ සතර දේවාල පෙරහර දළදා වීදිය, යටිනුවර වීදිය, කන්දේ වීදිය, ඩී.එස් සේනානායක වීදිය ඔස්සේ පැමිණ රජ වීදියෙන් ගමන් කර ගෙවැදීමට නියමිතය.

2024.08.18 වන දිනට යෙදූ රථවාහන සැලැස්ම මෙදිනටද ක්‍රියාත්මක කිරීමට නියමිතය. එදිනට මහනුවර නගරය හරහා යන වාහන සඳහා භාවිතා කරන විකල්ප මාර්ගයන් පහත පරිදි වේ.

### ❖ කටුගස්තොට සිට මහනුවර හරහා පේරාදෙණිය දෙසට ගමන් කරන වාහන

වට්ටාරන්තැන්නෙන් දකුණට හැරි කුඩා රත්වත්ත මාවතෙන් වමට ගමන් කර දොඩන්වල නව පාලමෙන් දකුණට හැරි ගොහාගොඩ ඔස්සේ පේරාදෙණිය දෙසට ගමන් කල හැක.

### ❖ කටුගස්තොට නගරයට පැමිණ කොළඹ, නුවරඑලිය හා පේරාදෙණිය දෙසට ගමන් කරන වාහන

ගොහාගොඩ මාර්ගයෙන් ගමන් කර ගන්නෝරුව හන්දියෙන් හැරී ගමන් කල හැක.

### ❖ කටුගස්තොට නගරයට පැමිණ දිගන, කුණ්ඩසාල හෝ මහියංගනයට ගමන් ගන්නා වාහන

මඩවල පාර ඔස්සේ ගමන් කර මඩවල නගරයෙන් දකුණට හැරී දිගන මාර්ගය ඔස්සේ ගමන් කළ හැක.

### ❖ කුරුණෑගල මාර්ගය ඔස්සේ මාතලේ දෙසට ගමන් ගන්නා වාහන

හදිසි සිදුවීමක් නිසා මාර්ගය අවහිර වුවහොත් විකල්ප මාර්ගයන් ලෙස හැදෙණිය නගරයෙන් මැදවලට හැරී මැදවල නගරය ඔස්සේ පූජාපිටිය නගරයට පිවිස එම ස්ථානයෙන් අඹතැන්න නගරයට ගමන් කර මාතලේ දක්වා ගමන් කල හැක.

### ❖ මාතලේ දෙස සිට පැමිණ කුරුණෑගල දෙසට ගමන් ගන්නා වාහන

අඹතැන්න හන්දියෙන් පූජාපිටියට ගොස් මැදවල නගරයෙන් හැදෙණිය ඔස්සේ කුරුණෑගලට ගමන් කල හැක.

- ❖ **කුරුණෑගල දෙසින් පැමිණ කොළඹ හෝ පේරාදෙණිය ගම්පොළ දෙසට ගමන් ගන්නා වාහන**

අලදෙණිය නගරයෙන් මුරුතලාව පාරේ ගමන් කර මුරුතලාව නගරය ඔස්සේ පොල්ගහමුල හන්දියට පැමිණ දකුණට කොළඹ දෙසටත්, වමට හැරී ගම්පොළ නුවරඑළිය දෙසටත් ගමන් කළ හැක.

- ❖ **ගොහාගොඩ මාර්ගය ඔස්සේ පැමිණ කුරුණෑගල දෙසට ගමන් ගන්නා වාහන**

හල්ඔළුව හන්දියෙන් වමට හැරී බරිගම හන්දියෙන් කුරුණෑගලට ගමන් කල හැක.

## ■ දහවල් පෙරහර - 2024.08.20

2024.08.20 වන දින දහවල් 12.46 ට සතර මහා දේවාල පෙරහර සණදෙවි කෝවිලෙන් පිටත්ව කටුකැලේ වීදිය, දළදා වීදිය, කොටුගොඩැල්ල වීදිය, කන්දේ වීදිය ඔස්සේ ඩී.එස් සේනානායක වීදිය මංසන්දියට පැමිණ ගෙඩිගේ විහාරයෙන් පිටත්වන දළදා පෙරහර ඩී.එස් සේනානායක වීදිය, පන්සල පාර ඔස්සේ දේව වීදියෙන් රජ වීදියට හැරී මාලිගාවට ගෙවැදීමට නියමිතය.

**විකල්ප මාර්ග**

- කටුගස්තොට දෙසින් ඇතුළු වන සියළුම වාහන මහයියාවෙන් තිලක් රත්නායක මාවත ඔස්සේ මහනුවර පොලිසිය හන්දිය දක්වා ගමන් කර යා යුතු වේ. නගරයෙන් කටුගස්තොට දෙසට යන වාහනද මහනුවර පොලිසිය හන්දියෙන් තිලක් රත්නායක මාවත ඔස්සේ ගමන් කල යුතු වේ.
- කටුගස්තොට දෙසින් පැමිණෙන සැහැල්ලු වාහන වාරියපොල සුමංගල මාවත ඔස්සේ බහිරවකන්ද වටරවුමට පැමිණ, එතැන් සිට අනිවත්ත රිවඩෙල් හන්දිය සහ අනිවත්ත බිංගෙය පසුකර පේරාදෙණිය පාර, දොඩංවල හන්දියට පැමිණිය හැක. නගරය දෙසින් කටුගස්තොට දෙසට පිටවන සැහැල්ලු වාහනද එම මාර්ගය ඔස්සේ ගමන් කල යුතු වේ.
- අම්පිටිය, තෙල්දෙණිය මාර්ගයේ පැමිණෙන වාහන වැව රවුම ඔස්සේ වේල්ස් පාර්ක් හන්දියට පැමිණ ඇහැලේපොල කුමාරිහාමි මාවත ඔස්සේ බෝගම්බරට පැමිණ දුම්රිය පොළ දෙසට ගමන් කල හැකිය.
- නගරයෙන් පිටවන අම්පිටිය හා තෙල්දෙණිය මාර්ගයට යන වාහන ඔරලෝසු කණුව වට රවුමෙන් දළදා වීදිය, රජිණ පැති දොරටුව අසලින් දකුණට හැරී ජෝයි බෝට්ටු සේවය පසුකර වේල්ස් පාර්ක් හන්දියට ගොස් වැව රවුම ඔස්සේ ගමන් කළ හැකිය. (ගණදෙවි කෝවිලේ සිට කොටුගොඩැල්ල වීදිය දක්වා පෙරහර ගමන් කරන අවස්ථාව හැර)
- පෙරහර ආරම්භ වීමෙන් පසු නගරයෙන් අම්පිටිය දෙසට පිටවන වන වාහන කැප්පෙටිපොළ හන්දියෙන් බෝගම්බර දෙසට ගමන් කර ඇහැලේපොළ කුමාරිහාමි මාවත, වේල්ස් පාර්ක් හන්දිය ඔස්සේ වැව රවුම දෙසට පිටවිය හැකි අතර, එම කාලය තුළ නගරය තුලට පැමිණෙන වාහන ද වැව රවුමෙන් පැමිණ වේල්ස් පාර්ක් හරහා පල්ලිය පාර, උඩුරාවණ පාර ඔස්සේ නගරයට ඇතුළු විය හැක.
- කොළඹ දෙසින් සිරිමාවෝ බණ්ඩාරනායක මාවතින් (පරණ පේරාදෙණිය පාර) පැමිණෙන වාහන තැපැල් පෙට්ටිය හන්දිය (උසස් බාලිකා විද්‍යාල අසලින්) එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මාවත ඔස්සේ ගුඩ්ෂෙඩ් බස් නැවතුම් පොල හරහා දුම්රිය ස්ථානය අසලින් නගරයට ඇතුළු වීම හා විලියම් ගොපල්ලව මාවත ඔස්සේ නගරයෙන් පිටවිය හැක.
- දහවල් පෙරහර වීථි සංචාරය කරන අවස්ථාවේදී පේරාදෙණිය හා කටුගස්තොට පොලිස් ස්ථාන සම්බන්ධීකරණය කර විකල්ප මාර්ග වශයෙන් ගොහාගොඩ, ධර්මාශෝක මාවත, ලේවැල්ල මාර්ගය භාවිතා කරමින් වාහන ගමන් කිරීමට සලසා ඇත.

පෙරහර පවත්නා සෑම දිනකම දහවල් 2.00 සිට බර වාහන ගමනාගමනය පහත රථවාහන සැලැස්ම අනුව ක්‍රියාත්මක වේ.

**බර වාහන ගමන් කිරීමේ මාර්ග සැලැස්ම**

- වත්තේගම, අලවතුගොඩ, කුරුණෑගල සිට පැමිණෙන වාහන ගොහාගොඩ මාර්ගයෙන් පේරාදෙණිය දෙසටද,
- නුවරඑළිය දෙස සිට කටුගස්තොට පැමිණෙන වාහන ගැටඹේ හන්දියෙන් ගොහාගොඩ මාර්ගයෙන් කටුගස්තොට දෙසටද,
- බදුල්ල - මහියංගනය දෙස සිට පැමිණෙන වාහන හුවැලිකඩ හන්දියෙන් ඉහත රථවාහන සැලැස්මට අනුව හරවා යැවීමට කටයුතු කරනු ලබයි.

පෙරහර පවත්වා කාල සීමාව තුළ රථ ගාල් 09 ක් සූදානම් කර ඇත.

**රථ ගාල් පිහිටි ස්ථාන පහත පරිදි වේ.**

- KMC රථගාල
- දුම්රිය පොල ඉදිරිපිට
- උසාවි සංකීර්ණය ඉදිරිපිට
- පේරාදෙණිය පාර හම්ජාඩ් රථගාල
- කරලිය රථගාල
- මහයියාව සුසාන භූමිය අසල
- අළුත්ගම ධම්මානන්ද මාවත
- එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මාවත
- සම්බෝධි මාවත

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**